# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 344/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 26/02/2024

පැය 1240

## මාධ්‍ය නිවේදනය

<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>

**01. 2024.02.25 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 03 | 03 | 50 | 100 | බැරල් 02 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. බලපත්‍ර නොමැතිව මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තිරුක්කෝවිල් කඳවුර**

2024.02.25 වන දින උදැසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා තිරුක්කෝවිල් කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත අක්කරපත්තුව පොලිස් වසමේ පනන්කාඩු ප්‍රදේශයේ මෙරට නිශ්පාදිත ගිනි අවියක් අත්අඩංගුවට සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා අක්කරපත්තුව පොලිස් ස්ථනය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් තම්බිළුවිල් ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.** අක්කරපත්තුව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. නීති විරෝධි විදේශීය දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුර.**

2024.02.25 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කෝප්පායි පොලිස් වසමේ කෝප්පායි

ප්‍රදේශයේ වැටලීමක් සිදු කර නීති විරෝධී විදේශීය දුම්වැටි 203 ක් සැකකරුවෙකු සමඟ අත්අඩංගුවට ගෙන කෝප්පායි පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වූ කෝප්පායි මධ්‍යම ප්‍රදේශවල** පදිංචිකරුවකු වේ. කෝප්පායි පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. මත්කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මන්නාරම කඳවුර.**

2024.02.25 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මන්නාරම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මන්නාරම පොලිස් වසමේ තාරාපුරම් ප්‍රදේශයේ වැටලීමක් සිදු මත්කරල් 250 ක් සැකකරුවෙකු සමඟ අත්අඩංගුවට ගෙන මන්නාරම පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වූ තාල්පාඩු ප්‍රදේශයේ** පදිංචිකරුවකු වේ. මන්නාරම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. බලපත්‍ර නොමැතිව පවත්වාගෙන ගිය ඖෂධ හලක් වටලා සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුර.**

2024.02.25 වන දින උදැසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පුත්තලම පොලිස් වසමේ පුත්තලම ප්‍රදේශයේ වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව පවත්වාගෙන ගිය ඖෂධ හලක් වටලා විවිධ වර්ගයේ ඖෂධ වර්ග 144 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ජාතික ඖෂධ හා නියාමන අධිකාරියේ නිලධාරීන්ට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වූ පුත්තලම ප්‍රදේශයේ** පදිංචිකරුවකු වේ.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**